# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2088/48 - 2018 සැප්තැම්බර් මස 12 වැනි බදාදා - 2018.09.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(2ඈ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

යෝජිත ඒකක 112කින් යුත් මහල් නිවාස සංකීර්ණය
අංක 460, කොළඹ පාර, උස්වැටකෙයියාව

**පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව**

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව කොළඹ 08, ඩී. එස්. සේනානායක මාවත, අංක 75, ප්‍රයිම් ලෑන්ඩ් පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කරන ලද උස්වැටකෙයියාව, කොළඹ පාර, අංක 460 දරන ස්ථානයේ ඉදිකිරීමට යෝජිත ඒකක 112කින් යුත් මහල් නිවාස සංකීර්ණ ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවලදී දිනපතා පෙ.ව. 08.30 සිට ප.ව. 4.15 දක්වා 2018.09.12 දින සිට දින 30ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර)

මීට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

| | | |
|---|---|---|
| 1. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | - | අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10 |
| 2. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | - | නව මහලේකම් කාර්යාලය, 4 වන මහල, මාලිගාවත්ත, කොළඹ 10. |
| 3. මධ්‍යම පරිසර අධිකාරිය | - | අංක 104, "පරිසර පියස", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල |
| 4. නාගරික සංවර්ධන අධිකාරිය | - | 6 හා 7 වන මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල |
| 5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | ගම්පහ |

1A - G 28518 - 27 (2018/09)

මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

| | | |
|---|---|---|
| 6. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | වත්තල |
| 7. ප්‍රාදේශීය සභාව | - | වත්තල |
| 8. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | - | දිස්ත්‍රික් කාර්යාලය, මීගමුව |
| 9. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | - | ප්‍රාදේශීය කාර්යාලය, අංක 452, කොළඹ පාර, කුරණ |

මෙම යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2018.09.12 වැනි දින සිට දින 30 ක් ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය, 4 වැනි මහල,
මාලිගාවත්ත, කොළඹ 10.
දුරකථන අංක : 011-2449754, 011-2449197, 011-2387922
ෆැක්ස් අංක : 011-2438005, 011-2472623

09-757

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.